සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

20945

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**25 S I-I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉතිහාසය I (I කොටස)
வரலாறு I (பகுதி I)
History I (Part I)

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට 1948 දක්වා**

විභාග අංකය: ..................................

**වැදගත්**
- ※ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිවාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ※ **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ※ කොටස් දෙකට ම මුළු කාලය පැය **තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

1. (1) දීපවංස (2) මහාවංස (3) හරිවංස (4) ධාතුවංස (5) බෝධිවංස (.........)

2. (1) මහාගාම (2) දීඝගාම (3) චන්දනගාම (4) කාජරගාම (5) උරුවෙල (.........)

3. (1) වේලුසුමන (2) දීඝජන්තු (3) සුරනිමල (4) ථෙරපුත්තාභය (5) පුස්සදේව (.........)

4. (1) පණ්ඩු (2) බුද්ධ පාරින්ද (3) තිරිතර (4) පිළයමාර (5) දඨිය (.........)

5. (1) I ජයබාහු (2) නිශ්ශංකමල්ල (3) II වික්‍රමබාහු (4) චෝඩගංග (5) සාහස්සමල්ල (.........)

6. (1) රංගිරි දඹුල්ල (2) ආළාහණ පිරිවෙන (3) හැටදාගේ (4) නිශ්ශංකලතා මණ්ඩපය (5) රන්කොත් වෙහෙර (.........)

7. (1) සෙංකඩගල (2) කටුපුළුනුවර (3) කන්දේනුවර (4) සිරිවඩ්ඩනපුර (5) මන්දරම්පුර (.........)

8. (1) සිලප්පධිකාරම් (2) මණිමේඛලෙයි (3) පදිට්ටුපත්තු (4) යාල්පාන වෛපවමාලෙයි (5) පට්ටිනප්පාලෙයි (.........)

9. (1) ෆ්‍රෙඩ්රික් නෝර්ත් (2) තෝමස් මේට්ලන්ඩ් (3) රොබට් බ්‍රවුන්රිග් (4) ජෝන් ඩොයිලි (5) එඩ්වඩ් බාර්න්ස් (.........)

10. (1) සිංහල මහජන සභා (2) හලාවත සංගමය (3) ලංකා ජාතික සංවිධානය (4) ලංකා ප්‍රතිසංස්කරණ සංගමය (5) ලංකා ජාතික සංගමය (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එක** යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියන්න.**

**11.** (1) සෙනවිරද් - සේනාපති
(2) මහලේනා - මහ ලේකම්
(3) අධිකාරි - මුදල් ලේකම්
(4) සිරිත්ලේනා - නීතිය පිළිබඳ ලේකම්
(5) දහම් පසක්නා - පුණ්‍ය කටුයුතු පිළිබඳ අධ්‍යක්ෂ (.........)

**12.** (1) ථූපාරාම දගැබ - දේවානම්පිය තිස්ස
(2) සේරුවිල දගැබ - කාවන්තිස්ස
(3) අභයගිරි දගැබ - වළගම්බා
(4) අම්බස්තල චෛතිය - උත්තිය
(5) කිරිවෙහෙර - I පරාක්‍රමබාහු (.........)

**13.** (1) වීරසෝලියම් - දෙමළ ව්‍යාකරණ ග්‍රන්ථයකි.
(2) පූජාවලිය - දළදා වහන්සේට පැවැත්වූ පූජා පිළිබඳ විස්තර ඇතුළත් කෘතියකි.
(3) සමන්තපාසාදිකා - විනය පිටකයට අටුවා ග්‍රන්ථයකි.
(4) පැරකුම්බා සිරිත - ප්‍රශස්ති කාව්‍යයකි.
(5) කඩවුරු සිරිත - රජවරුන්ගේ දෛනික ජීවිතය පිළිබඳ විස්තර ඇතුළත් කෘතියකි. (.........)

**14.** (1) මේට්ලන්ඩ් - රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
(2) බ්‍රවුන්රිග් - උඩරට රාජ්‍යය බිඳ වැටීම
(3) බාර්න්ස් - කොළඹ-නුවර මාර්ගය ඉදිකිරීම ඇරඹීම
(4) ගොර්ඩන් - කොටහේන කෝලාහලය
(5) හැව්ලොක් - ධාන්‍ය බද්ද අවලංගු කිරීම (.........)

**15.** (1) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ - ගම්සභාව අවලංගු කිරීම
(2) කෲ-මැකලම් ප්‍රතිසංස්කරණ - සීමිත ඡන්ද බලය හඳුන්වාදීම
(3) මැනිං-ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ - ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාශ ක්‍රමය හඳුන්වාදීම
(4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණ - විධායක කාරක සභා ක්‍රමය හඳුන්වාදීම
(5) සෝල්බරි ප්‍රතිසංස්කරණ - උත්තර මන්ත්‍රී මණ්ඩලය හඳුන්වාදීම (.........)

● අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. **නිවැරදි** සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

**16.**

| X | Y |
|---|---|
| (i) කළු ගඟ | A පබ්බතන්ත ඇළ |
| (ii) අඹන් ගඟ | B මිනිපේ ඇළ |
| (iii) මහවැලි ගඟ | C ඇළහැර ඇළ |
| (iv) දැදුරු ඔය | D හත්තොට අමුණ |
| (v) මල්වතු ඔය | E සූකර නිජ්ජර |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) වසභ | A හුරුළු වැව |
| (ii) මහාසේන | B මහවිලච්චිය වැව |
| (iii) I උපතිස්ස | C නාච්චදූව වැව |
| (iv) මොග්ගල්ලාන | D කන්තලේ වැව |
| (v) II අග්ගබෝධි | E තෝපා වැව |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**18.**

| X | Y |
|---|---|
| (i) I රාජරාජ | A පාණ්ඩ්‍ය |
| (ii) මාඝ | B කලිංග |
| (iii) චන්ද්‍රභානු | C චීන |
| (iv) ජටාවර්මන් | D ජාවක |
| (v) චෙං-හෝ | E චෝළ |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

**19.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මුන්නේශ්වරම් කෝවිල | A | නල්ලූර් |
| (ii) | කන්දස්වාමි කෝවිල | B | දෙවිනුවර |
| (iii) | තිරුක්කෝවිල් | C | හලාවත |
| (iv) | උපුල්වන් දේවාලය | D | මඩකලපුව |
| (v) | නාථ දේවාලය | E | මහනුවර |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්‍රි.ව. 1521 | A | I රාජසිංහ විසින් මහනුවර රාජධානිය ආක්‍රමණය කිරීම |
| (ii) | ක්‍රි.ව. 1557 | B | ධර්මපාල කතෝලික ආගමට හැරීම |
| (iii) | ක්‍රි.ව. 1562 | C | පෘතුගීසීන් කෝට්ටේ රාජ්‍යයේ අයිතිය ලබාගැනීම |
| (iv) | ක්‍රි.ව. 1582 | D | මුල්ලේරියා සටන |
| (v) | ක්‍රි.ව. 1597 | E | විජයබා කොල්ලය |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**21.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | විඩොර් ද පසෙන්ඩා | A | විනිශ්චයකාරවරයා |
| (ii) | ඔව්ඩොර් | B | ආදයම් කටයුතුභාර ප්‍රධාන නිලධාරි |
| (iii) | ඔපර්කුප්මන් | C | කණිෂ්ඨ වෙළෙන්ද |
| (iv) | ඔන්ඩර්කුප්මන් | D | කුරුඳු පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| (v) | මහබද්දේ කපිතාන් | E | ජ්‍යෙෂ්ඨ වෙළෙන්ද |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**22.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | හෙන්රි වෝර්ඩ් | A | ඉරක්කාමම් වැව |
| (ii) | හර්කියුලිස් රොබින්සන් | B | කන්තලේ වැව |
| (iii) | විලියම් ග්‍රෙගරි | C | තිස්සමහාරාම වැව |
| (iv) | ආර්තර් ගෝර්ඩන් | D | යෝධ වැව |
| (v) | වෙස්ට් රිජ්වේ | E | කලා වැව |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**23.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | සබරගමුව | A | ගලබොඩ |
| (ii) | නුවරකලාවිය | B | මඩුගල්ලේ |
| (iii) | හතර කෝරළේ | C | ඇහැලේපොල |
| (iv) | දුම්බර | D | මොල්ලිගොඩ |
| (v) | ඌව | E | කැප්පෙටිපොල |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**24.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන | A | සර් පොන්නම්බලම් රාමනාදන් |
| (ii) | මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන | B | රත්මලානේ ධම්මාලෝක හිමි |
| (iii) | පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන | C | හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි |
| (iv) | වන්නැර්පන්නෙයිහි ශෛව ප්‍රගාස විද්‍යා ශාලෙයි | D | වලානේ ශ්‍රී සිද්ධාර්ථ හිමි |
| (v) | තිරුනෙල්වේලිහි පරමේෂ්වර විද්‍යාලය | E | ආරුමුග නාවලර්තුමා |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

**25.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ශ්‍රේෂ්ඨාධිකරණය පිහිටුවීම | A | ෆ්‍රෙඩ්රික් නෝර්ත් |
| (ii) | ජූරි සභා ක්‍රමය ආරම්භ කිරීම | B | රොබට් විල්මට් හෝර්ටන් |
| (iii) | දිස්ත්‍රික් උසාවි පිහිටුවීම | C | තෝමස් මේට්ලන්ඩ් |
| (iv) | රික්වෙස්ට් උසාවි පිහිටුවීම | D | හර්කියුලීස් රොබින්සන් |
| (v) | ගම්සභා උසාවි පිහිටුවීම | E | ස්ටුවර්ට් මැකෙන්සි |

(1) ACBED (2) BAECD (3) CADBE (4) DCBEA (5) EBDAC (.........)

[ හතරවෙනි පිටුව බලන්න.

● අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................ **1** ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ **2** ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................ **3** ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ **4** ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5 ද, තිත් ඉර මත ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26. ලංකාවේ මුල් ජනාවාස සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) මුල් පදිංචිකරුවන් ඉන්දියාවේ විවිධ ප්‍රදේශවලින් පැමිණි බව විශ්වාස කෙරේ.
(B) මුල් ජනාවාස පිහිටුවන ලද්දේ ගංගා ආශ්‍රිතව ය.
(C) මුල් පදිංචිකරුවන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය විය.
(D) මුල් පදිංචිකරුවන් අතර වෙළඳ කණ්ඩායම් ද සිටියහ. (.........)

**27. රෝහණය එක්සත් කිරීම සඳහා කාවන්තිස්ස රජු අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේ ද?**
(A) විවාහ සම්බන්ධතා
(B) යුධමය ක්‍රියාමාර්ග මගින් යටත්කිරීම
(C) ආගමික ක්‍රියාමාර්ග
(D) වරපුරුෂ සේවය (.........)

**28. පැරණි ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය / ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) පොළොන්නරු යුගයේ දී ශ්‍රී ලංකාව හා යුරෝපය අතර සෘජු වාණිජ සබඳකම් පැවතුණි.
(B) ආරම්භයේ පටන් ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර සමීප වෙළඳ සබඳතා පැවතුණි.
(C) අනුරාධපුර යුගයේ දී මහාතිත්ථ වැදගත් වරායක් විය.
(D) රෙදිපිළි, අශ්වයන් සහ පිඟන් භාණ්ඩ කෝට්ටේ අවධියේ දී චීනයට අපනයනය කරන ලදී. (.........)

**29. කෝට්ටේ රාජධානිය තුළ පෘතුගීසි බලය පිහිටුවීමෙහි ලා බලපෑ සාධක කවරේ ද?**
(A) පෘතුගීසීන් සතු නාවික බලය
(B) කෝට්ටේ රජු පෘතුගීසීන්ට දක්වූ අනුග්‍රහය
(C) VII බුවනෙකබාහු රජු කතෝලික ආගම වැළඳගැනීම
(D) කෝට්ටේ රාජ්‍යයට එරෙහිව උඩරට හමුදාව ලබා දුන් සහාය (.........)

**30. ඩොනමෝර් කොමිසමේ ප්‍රධාන නිර්දේශ කවරේ ද?**
(A) නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීම
(B) විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම
(C) වාර්ගික නියෝජන ක්‍රමය තවදුරටත් පවත්වාගෙන යාම
(D) රාජ්‍ය සේවා කොමිසන් සභාව පිහිටුවීම (.........)

● අංක **31** සිට **35** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ**. එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය තිත් ඉර මත ලියන්න.**

**31. ඉසුරුමුණි කැටයම්**
(1) ඉසුරුමුණි කැටයම් අතර ප්‍රධාන එකක් වන්නේ මිනිසා සහ අශ්ව හිස කැටයම ය.
(2) පෙම්යුවළ දක්වන කැටයම සාලිය සහ අශෝකමාලා විදහා දක්වන බවට මතයක් පවතී.
(3) දියකෙළින ඇතුන්ගේ කැටයම් මහමල්ලපුරම් හි කැටයම් හා සමානත්වයක් දරයි.
(4) පුරාවිද්‍යාත්මක සාධක අනුව මෙම කැටයම් අවසන් කරන ලද්දේ වළගම්බා රජු සමයේ දී ය.
(5) මෙම කැටයම් පිහිටි ඉසුරුමුණිය විහාරය පුරාණයේ දී උපුල්වන් කසුබ්ගිරි විහාරය නමින් හඳුන්වා ඇත. (.........)

**32. II පරාක්‍රමබාහු රජු**
(1) III විජයබාහු රජුගේ මරණයෙන් පසු II පරාක්‍රමබාහු රජවිය.
(2) මොහුගේ රාජ්‍ය කාලයේ මුල් වර්ෂවලදී පාණ්ඩ්‍ය ආක්‍රමණයක් සිදු විය.
(3) ඔහු දන්තධාතුව දඹදෙණියට වැඩම කරවිය.
(4) ඔහුගේ පාලන සමයේදී පූජාවලිය රචනා කරන ලදී.
(5) දඹදෙණි කතිකාවත සකස් කිරීමට ඔහු අනුග්‍රහය දැක්විය. (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

20945

33. **ලන්දේසි ආගමික ප්‍රතිපත්තිය**
(1) පාසල් හා පල්ලි මගින් ආගම් ප්‍රචාරය කිරීම
(2) කතෝලික ආගම මර්දනය කිරීම
(3) සියලු ම ලන්දේසි පූජකවරුන්ට වැටුප් ගෙවන ලද්දේ වෙළඳ සමාගම විසිනි.
(4) සිවිල් පරිපාලනයේ ඉහළ තනතුරු දෙන ලද්දේ ඔවුන්ගේ ආගම ඇදහුවන්ට ය.
(5) සුප්‍රසිද්ධ ලන්දේසි පූජකවරයකු වූ ගොන්සාල්වේස් පියතුමා, උඩරටියන් රෙපරමාදු ආගමට හැරවී ය. (.........)

34. **කෝපි වගාව**
(1) පළමුවන කෝපි වත්ත සිංහපිටියේ දී ජෝර්ජ් බර්ඩ් විසින් ආරම්භ කරන ලදී.
(2) එඩ්වර්ඩ් බාන්ස් ආණ්ඩුකාරයා විසින් ගන්නොරුවේ රජයේ කෝපි වත්තක් පිහිටුවන ලදී.
(3) ධූල්කඳුර වත්ත ආදර්ශ කෝපි වත්තක් ලෙස සලකනු ලැබී ය.
(4) 1835 දී කෝපිවලින් එංගලන්තයේ දී අය කළ බද්ද අඩුකිරීමත් සමඟ කෝපි අපනයනය ඉහළයාම ඇරඹිණ.
(5) කොළ රෝගයක් හේතු කොට ගෙන කෝපි වගාව බිඳ වැටුණි. (.........)

35. **ඉන්දියානු සංක්‍රමණික ශ්‍රමය**
(1) වතුකරුවන් විසින් තම ශ්‍රම ප්‍රශ්නය විසඳන ලද්දේ දකුණු ඉන්දියානුවන් ඒ සඳහා බඳවා ගැනීමෙනි.
(2) ඉන්දියානු ශ්‍රමිකයන් මාර්ග බද්දෙන් නිදහස් කරන ලදී.
(3) හෙන්රි ආතර් බ්ලේක් ආණ්ඩුකාර සමයේ දී ඉන්දියානු ශ්‍රමිකයන් පිළිබඳ සොයා බැලීම සඳහා කම්කරු කොමසාරිස්වරයකු පත්කරන ලදී.
(4) 1927 දී ඉන්දියානු ශ්‍රමිකයන්ගේ අවම වැටුප් පනත අනුමත කරන ලදී.
(5) සියලු ම වැඩිහිටි ඉන්දියානු ශ්‍රමිකයන්ට ද ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ සර්වජන ඡන්ද බලය ලබා දෙන ලදී. (.........)

● අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැනි ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | බුද්ධාගම මෙරට ස්ථාපිත කිරීමට නම් මෙරට උපන්නකු මෙරට දී විනය ඉගෙනගෙන, විනය දේශනා කළ යුතුයයි මිහිඳු හිමියෝ වදාළහ. | සංඝමිත්තා තෙරණිය විසින් අනුලා බිසව මහණ කොට මෙරට මෙහෙණිසස්න පිහිටුවන ලදී. | (.........) |
| 37. | ගම්පොළ රාජධානියේ ආරම්භකයා හතරවන බුවනෙකබාහු රජු ය. | යාපනයේ ආර්යචක්‍රවර්ති ගම්පොළ රාජධානියට අයත් ප්‍රදේශවලින් බදු අය කළේ ය. | (.........) |
| 38. | 1546 දී පෘතුගීසීන්ගේ පළමුවන උඩරට ආක්‍රමණය මෙහෙයවූයේ ද නොරොඤ්ඤ ය. | 1803 දී බ්‍රිතාන්‍යයන්ගේ පළමුවන උඩරට ආක්‍රමණය මෙහෙවන ලද්දේ මැක්ඩොනල්ඩ් සෙනවි විසිනි. | (.........) |
| 39. | අධ්‍යාපන මාධ්‍යය ඉංග්‍රීසි විය යුතුයයි කෝල්බෲක් නිර්දේශ කළේ ය. | මෙම යෝජනාවේ මූලික පරමාර්ථය වූයේ පරිපාලන අවශ්‍යතා සඳහා දේශීයයන් පුහුණු කිරීම සහ යුරෝපීය සංස්කෘතියට නැඹුරු වූ සමාජ පන්තියක් බිහිකිරීම ය. | (.........) |
| 40. | ඉංග්‍රීසීන් විසින් මාර්ග ඉදිකරනු ලැබීම හේතු කොට ගෙන බ්‍රිතාන්‍ය යුද ආධිපත්‍යය උඩරට ප්‍රදේශවල දඩිලෙස ස්ථාපිත කෙරිණ. | 19 වන සියවසේ දී මාර්ග ඉදිකිරීමෙහි ලා මහඟු සේවයක් ඉටුකළේ මේජර් තෝමස් ස්කිනර් විසිනි. | (.........) |

**

[ හයවැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

25 S I-II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉතිහාසය I (II කොටස)
வரலாறு I (பகுதி II)
History I (Part II)

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට 1948 දක්වා**

* **දහවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(ප්‍රශ්න අංක 10 ට පිළිතුරු සැපයීම සඳහා **ශ්‍රී ලංකාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. අනුරාධපුර සමයේ දේශපාලන ඉතිහාසය හැදෑරීමෙහි ලා මූලාශ්‍රයක් වශයෙන් සෙල්ලිපිවලට හිමිවන වැදගත්කම ප්‍රමාණ කරන්න. (ලකුණු 14 යි)

2. "මහාසේන රජු බොහෝ පින් ද බොහෝ පව් ද රැස් කළේ ය."
   (i) මහසෙන් රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) මහසෙන් රජු විසින් කරවන ලද වැව් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) මහසෙන් රජු මහාවිහාරයට විරුද්ධව ක්‍රියා කිරීමට තුඩුදුන් සාධක සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
   (iv) මහසෙන් රජුගේ කාර්ය සාඵල්‍යය සම්බන්ධයෙන් ඉහත සඳහන් මහාවංස ප්‍රකාශය විචාරාත්මකව විමසන්න. (ලකුණු 07 යි)

3. "I විජයබාහු රජු පොළොන්නරු යුගයේ සිට රජකළ ශ්‍රේෂ්ඨ පාලකයෙකි." පහත සඳහන් මාතෘකා ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.
   (i) විදේශ ආධිපත්‍යයෙන් රට මුදගැනීම සහ රට එක්සේසත් කිරීම
   (ii) ඔහුගේ ශාසනික කටයුතු (ලකුණු 14 යි)

4. රජරට ශිෂ්ටාචාරයේ පරිහානියට හා බිඳ වැටීමට තුඩුදුන් ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 14 යි)

5. ආරම්භයේ සිට 1619 දක්වා යාපන රාජධානියේ දේශපාලන ඉතිහාසයේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. (ලකුණු 14 යි)

6. පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය සාකච්ඡා කරන්න.
   (i) පරිපාලනය (ii) අධිකරණය (iii) අධ්‍යාපනය (ලකුණු 14 යි)

7. වැලිවිට ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන්ගෙන් බුද්ධ ශාසනයට සිදු වූ සේවාව පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

8. "1817 - 1818 උඩරටියන්ගේ නැගීසිටීම, ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහස් අරගලය විය." එම සටනට තුඩුදුන් සාධක ඇසුරෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

9. පහත දක්වෙන මාතෘකාවලින් **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   (i) පොළොන්නරු සමයේ ගෘහනිර්මාණ ශිල්පය
   (ii) පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ
   (iii) බ්‍රිතාන්‍යයන් යටතේ රාජකාරි ක්‍රමය
   (iv) 1910 සිට 1931 දක්වා ව්‍යවස්ථාදායක සභාවේ පැවැති නියෝජන ක්‍රමය. *(එක් කොටසකට ලකුණු 07 බැගිනි)*

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කොට**, ඒවායින් ඕනෑම ස්ථාන **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) ඌරා තොට (ii) මධ්‍යම පළාත
   (iii) දැදුරු ඔය (iv) කලා වැව
   (v) මල්වාන (vi) ත්‍රිකුණාමළය
   (vii) සිතුල්පව්ව (viii) දීඝවාපි
   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

***

20944

AL/2010/25-S/T/E-I

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය I
வரலாறு I
History I

25

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 10

විභාග අංකය / சுட்டெண் / Index No. } ......................................



18678

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**25-A | S | II-I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

ඉන්දියාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා

විභාග අංකය: ....................................

**වැදගත්**

* මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිවාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත** ලියන්න.

1. (1) කාවේරි (2) ක්‍රිෂ්ණා (3) රාවි (4) නර්මදා (5) තුංගභද්‍රා (.........)

2. (1) යදු (2) පුරු (3) අනු (4) පුලින්ද (5) තුර්වාස (.........)

3. (1) චතුර්වේද (2) පුරාණ (3) බ්‍රාහ්මණ (4) ආරණ්‍යක (5) උපනිෂද් (.........)

4. (1) සුප්පාරක (2) චම්පා (3) කෞෂම්බි (4) වාරාණසි (5) මථුරා (.........)

5. (1) ගෝපාල (2) ධර්මපාල (3) දේවපාල (4) නාරායනපාල (5) මහේන්ද්‍රපාල (.........)

6. (1) මණ්ඩලම් (2) කෝට්ටම් (3) භුක්ති (4) වලනාඩු (5) නාඩු (.........)

7. (1) ඉන්දු-ග්‍රීක (2) සක (3) පාර්තියන් (4) ශුංග (5) කුෂාණ (.........)

8. (1) රත්නාවලී (2) ශාකුන්තල (3) නාගානන්ද (4) ප්‍රියදර්ශිකා (5) කාදම්බරී (.........)

9. (1) දෙමළ (2) තෙළිඟු (3) මලයාලම් (4) දේවනාගරී (5) කණ්ණඩ (.........)

10. (1) ගර්භගෘහ (2) අන්තරාල (3) මණ්ඩප (4) විමාන (5) චෛත්‍යශාලා (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය, ඉදිරියේ** ඇති **තිත් ඉර මත** ලියන්න.

**11.** (1) සිමුක - සාතවාහන
(2) ගොන්ඩොපර්නීස් - පාර්තියන්
(3) ඩෙමිට්‍රියස් - යවන
(4) නහපාන - බැක්ට්‍රියන්
(5) චෂ්ටන - ශක (.........)

**12.** (1) මක්ඛලී ගෝසාල - ජෛන
(2) බුද්ධඝෝෂ - ථෙරවාද
(3) නාගර්ජුන - මහායාන
(4) අසංග - යෝගාචර
(5) සංකරර් - අද්වයිත වේදන්ත (.........)

**13.** (1) අයිහෝලේ - II පුලකේශින්
(2) හිටරි - II චන්ද්‍රගුප්ත
(3) ධෞලි - අශෝක
(4) ජුනාගාර්ඩ් - රුද්‍රදමන්
(5) හතිගුම්පා - ඛාරවේල (.........)

**14.** (1) දේවපුත්‍ර - කනිෂ්ක
(2) මහා රාජාධිරාජ - අශෝක
(3) පරම භාගවත - II චන්ද්‍රගුප්ත
(4) දක්ෂිණපථපති - I සාතකර්ණි
(5) ගංගෙයිකොණ්ඩ - I රාජේන්ද්‍ර (.........)

**15.** (1) මෛත්‍රික - වලභි
(2) මෞඛරී - කනෞජ්
(3) කාන්ව - ඩෙකානය
(4) ගෞඩ - බෙංගාලය
(5) ගූර්ජර - රාජපුතානා (.........)

● අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. **නිවැරදි** සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත** ලියන්න.

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | කාලිදස | A | වික්‍රමෝර්වෂී |
| (ii) | භාස | B | දශකුමාරචරිත |
| (iii) | දණ්ඩින් | C | අෂ්ටාධ්‍යායි |
| (iv) | පානිණි | D | බුද්ධ චරිත |
| (v) | අශ්වඝෝෂ | E | ස්වප්න වාසව දත්තා |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | භාරවි | A | සිංහවිෂ්ණු |
| (ii) | වසුමිත්‍ර | B | හර්ෂවර්ධන |
| (iii) | ෆා හියන් | C | මෙනැන්ඩර් |
| (iv) | නාගසේන | D | කනිෂ්ක |
| (v) | හියුං සාං | E | II චන්ද්‍රගුප්ත |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ඉත් සිං | A | චීන සංචාරකයෙකි |
| (ii) | මාධවභට්ට | B | අරාබි ලේඛකයෙකි |
| (iii) | අල්බිරූනි | C | දෙමළ කවියෙකි |
| (iv) | ඉලංගො අඩිගාල් | D | ශෛව සාන්තුවරයෙකි |
| (v) | තිරුමූලර් | E | සංස්කෘත කවියෙකි. |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

19.

| | X | | Y |
|---|---|---|---|
| (i) | කාවේරි | A | තංජෝර් |
| (ii) | සත්ලෙජ් | B | රූපාර් |
| (iii) | යමුනා | C | ප්‍රතිශ්ඨාන |
| (iv) | ගෝදාවරි | D | භාරුකච්ඡ |
| (v) | නර්මදා | E | ඉන්ද්‍රප්‍රස්ථ |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (.........)

20.

| | X | | Y |
|---|---|---|---|
| (i) | පද්‍ය | A | ගීත ගෝවින්ද |
| (ii) | ගද්‍ය | B | රාජතරංගිනී |
| (iii) | ව්‍යාකරණ | C | කථා සරිත් සාගර |
| (iv) | ඉතිහාස | D | මාලතීමාධව |
| (v) | නාට්‍ය | E | මහාභාෂ්‍ය |

(1) ABECD (2) ADECB (3) ACEBD (4) AEBCD (5) ACBED (.........)

● අංක **21** සිට **25** තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

21. **බෞද්ධ සාහිත්‍යයට අනුව ගණ රාජ්‍ය නො වන ආණ්ඩු ක්‍රමයක් පැවැතියේ කොහේ ද?**
(1) කෝලිය (2) ලිච්ඡවි (3) විදේහ
(4) මල්ල (5) අවන්ති (.........)

22. **හියුං සාං භික්ෂුව ඉගෙනගත් විශ්වවිද්‍යාලය කුමක් ද?**
(1) වලභි (2) නාලන්දා (3) වික්‍රමශිලා
(4) තක්ෂිලා (5) ඕදන්තපුරි (.........)

23. **මහාරාෂ්ට්‍රයේ බෞද්ධ සිද්ධස්ථාන, හින්දු හා ජෛන සිද්ධස්ථාන එකට දක්නට ඇති ගුහා සංකීර්ණය මින් කුමන ස්ථානයේ ද?**
(1) අජන්තා (2) බදාමි (3) භාග්
(4) එල්ලෝරා (5) කාර්ලේ (.........)

24. **දකුණු ඉන්දියානු හා ශ්‍රී ලංකා හමුදා අතර සිදු වූ සටන් පිළිබඳ ව දැක්වෙන සෙල්ලිපියක් පිහිටියේ කොහේ ද?**
(1) ජුනාගාර්ඩ් (2) අයිහෝලේ (3) ආර්පාක්කම්
(4) බේලූර් (5) හතිගුම්පා (.........)

25. **රාෂ්ට්‍රකූට I කෘෂ්ණ විසින් ඉදිකරවන ලද සුප්‍රසිද්ධ දේවාලය කුමක් ද?**
(1) එල්ලෝරාහි කෛලාස දේවාලය (2) තංජෝරයේ බෘහදේශ්වර දේවාලය
(3) පත්තඩකල් විරූපාක්ෂ දේවාලය (4) පුරි හි භුවනේෂ්වර දේවාලය
(5) බේලූර්හි චෙන්නකේසව දේවාලය (.........)

● අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

26. **ඍග්-වෛදික ජනයාගේ සමාජ තත්ත්වය**
(1) සමාජය තවමත් ගෝත්‍රික අවධියේ විය.
(2) සමාජයේ පදනම වූයේ පීතෘමූලික පවුල ය.
(3) පුර වටා සමාජය කේන්ද්‍රගතව තිබිණ.
(4) ඒක පත්නි විවාහය පිළිගත් විවාහ ක්‍රමය විය.
(5) මහජනතාවගේ මතය සභා සහ සමිති මගින් ප්‍රකාශ කෙරිණ. (.........)

27. **මහාපද්ම නන්ද**
(1) ඔහු මගධයේ නන්ද රාජවංශයේ ආරම්භකයා විය.
(2) ඔහුගේ අධිරාජ්‍යයට පංජාබය හා කාශ්මීරය ඇතුළු මුළු උතුරු ඉන්දියාව ම අයත් විය.
(3) ඔහුගේ පුතුන් අටදෙනා ඔහු ඇවෑමෙන් රාජ්‍යත්වයට පත්වූහ.
(4) මහාපද්ම නන්ද සහ අනුගාමිකයන් පිළිබඳ තොරතුරු ලැබෙන ප්‍රධාන මූලාශ්‍රය වන්නේ පුරාණ ග්‍රන්ථයෝ ය.
(5) ක්ෂත්‍රියන් විනාශ කළ එනම් දෙවන පරශුරාම ලෙස ඔහු පුරාණ ග්‍රන්ථවල හඳුන්වා ඇත. (.........)

18678

**28.** සාතවාහන රාජ්‍යවංශය

(1) පුරාණ ග්‍රන්ථවල සාතවාහනයන් ආන්ද්‍රයන් ලෙස ද හැඳින්වේ.
(2) ඔවුන්ගේ ආධිපත්‍ය කේන්ද්‍රගතව පැවැතියේ ගෝධාවරී හා ක්‍රිෂ්ණා නිම්නවල ය.
(3) සාතවාහනයන්ගේ අගනුවර ප්‍රතිෂ්ඨාන විය.
(4) දක්ෂිණාපථයේ පළමු අධිරාජ්‍ය පිහිටුවන ලද්දේ සාතවාහනයන් විසිනි.
(5) සාතවාහනයන් බ්‍රාහ්මණ ආගම හැර සෙසු ආගම් නො ඉවසූහ. (.........)

**29.** පල්ලව සභ්‍යත්වය

(1) එම රාජ්‍ය අවධියේ දී පල්ලවයන්ගේ අගනුවර වූ කාංචිය ඉන්දියාවේ වැදගත් සංස්කෘතික මධ්‍යස්ථානයක් විය.
(2) දේවාල ඉදිකිරීමේ නව සම්ප්‍රදායක් වූ රථ නම් වූ අංගය ඔවුන් විසින් හඳුන්වා දෙන ලදී.
(3) පල්ලව සමයේ ඉදිවූ දේවාලවල රජවරුන්ගේ ජීවන අවස්ථා කැටයම් කොට ඇත.
(4) මදුරෙයි හි මහා දේවාලය ඔවුන් විසින් ඉදිකරන ලද වැදගත් නිර්මාණයක් විය.
(5) පල්ලව රාජ්‍ය සමයේ දී මත්ත විලාස ප්‍රහසන ග්‍රන්ථය රචනා කෙරිණ. (.........)

**30.** අරාබි ආක්‍රමණ

(1) ක්‍රි. ව. 712 දී මොහොමඩ් බින් ක්වාසිම් යටතේ පැමිණි අරාබීන් විසින් දහීර් රජු යටතේ පැවැති සින්ඩ් යටත් කරගන්නා ලදී.
(2) බැග්ඩෑඩයේ කාලිප් විසින් ජුනයිඩ් නමැත්තා සින්ඩ්හි ආණ්ඩුකාරයා ලෙස පත්කළේ ය.
(3) ඉස්ලාම් ආගම වැළඳගැනීම ප්‍රතික්ෂේප කළ හින්දූන්ගෙන් ජිෂ්‍යා නමැති බද්ද අයකරන ලදී.
(4) අරාබි පාලකයන් විසින් ඔවුන් යටතේ පැවැති ප්‍රදේශවල පදිංචිවීමට අරාබීන් පොලඹවන ලද්දේ ය.
(5) අන්තිමේ දී ඉන්දියාවෙන් අරාබීන් පලවාහැරීමට රාජ්පුත් පාලකයෝ සමත්වූහ. (.........)

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .......................................... **1 ද,**
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **2 ද,**
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .......................................... **3 ද,**
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .......................................... **4 ද,**
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5 ද, තිත් ඉර මත ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**31.** මෙගස්තිනිස්

(A) මෙගස්තිනිස් චනාහි චන්ද්‍රගුප්ත මෞර්ය රාජ සභාවේ සිටි සෙලියුකස් නිකේටර්ගේ තානාපතිවරයා ය.
(B) ඔහු විසින් රචනා කළ ඉන්ඩිකා ග්‍රන්ථයේ චන්ද්‍රගුප්ත මෞර්ය සමයේ ඉන්දියාවේ වැසියන්, පාලන ක්‍රමය හා පාලන සංස්ථා පිළිබඳ තොරතුරු අඩංගු වේ.
(C) ඔහුගේ ග්‍රන්ථයේ අශෝක රජුගේ කාලිංග යුද්ධය පිළිබඳවත් තොරතුරු අඩංගුවේ.
(D) අශෝක සිංහාසනාරූඪ වන විට දී මෙගස්තිනිස් මෞර්ය රාජ්‍ය සභාවේ සිටියේ ය. (.........)

**32.** බින්දුසාර

(A) පුරාණ ග්‍රන්ථ අනුව බින්දුසාර අවුරුදු 25 ක් මගධය පාලනය කළේ ය.
(B) අවන්තියේ කැරැල්ලක් ඇති වූ විට දී ඔහු තම පුත්‍ර අශෝක එය මැඩලීමට පිටත්කර හැරියේ ය.
(C) බින්දුසාර රජුගේ රාජ්‍ය සභාවට සිරියානු අධිරාජයා විසින් ඩයිමාකෝස් තානාපති ලෙස පත්කර එවන ලද්දේ ය.
(D) තම පියාගෙන් උරුම වූ අධිරාජ්‍ය ආරක්ෂා කර ගැනීමට ඔහු අසමත් විය. (.........)

**33.** සුංගයෝ

(A) සුංගයෝ ක්ෂත්‍රිය වංශයට අයත් වූහ.
(B) අන්තිම මෞර්ය රජ වූ බෘහද්රථ මරා සුංග වංශයේ ආරම්භකයා වූ පුෂ්‍යමිත්‍ර සුංග සිංහාසනාරූඪ විය.
(C) සුංගයන් විසින් ග්‍රීකයන් තවදුරටත් ඉන්දියාවට කඩාවැදීම වළක්වන ලදී.
(D) අමරාවතී හි බුදුරජාණන් වහන්සේ පිළිබඳ දක්වෙන කැටයම් කොටවන ලද්දේ සුංග පාලන සමයේ දී ය. (.........)

**34.** **සකවරු**

(A) සකවරු ඉන්දියාවට ඇතුළුවූයේ බයිබර් දූර්ගය හරහා ය.
(B) ඔවුහු බෙංගාලය දක්වා තම ආධිපත්‍ය වර්ධනය කිරීමට සමත්වූහ.
(C) ඉන්දියාවට පැමිණි සකවරුන්ගේ කණ්ඩායම් හතරක් තක්ෂිලා, මථුරා, උජ්ජේනි හා මහාරාෂ්ට්‍ර කේන්ද්‍ර කොටගෙන පදිංචි වූහ.
(D) සකවරුන්ගේ ප්‍රාන්තභාර ආණ්ඩුකාරවරුන් හඳුන්වන ලද්දේ ක්ෂත්‍රප නමිනි. (………)

**35.** **පාණ්ඩ්‍යයෝ**

(A) පාණ්ඩ්‍යයන් තම අධිරාජ්‍යයේ දකුණු සීමාවේ සිටි නිදහස් ජාතියක් ලෙස අශෝකගේ 13 වන ගිරි ලිපියේ දැක්වේ.
(B) හත්වන සියවස ආරම්භයේ දී පළමුවන පාණ්ඩ්‍ය රාජ්‍ය ප්‍රතිෂ්ඨාපනය ලද්දේ කඩුන්ගෝන් විසිනි.
(C) හත්වන සියවස මැද දී පමණ පැවැති පාණ්ඩ්‍යය රාජ්‍යය එහි ජනතාව හා ආගමික කටයුතු පිළිබඳ තොරතුරු හියුං සාං විසින් ඉදිරිපත් කොට ඇත.
(D) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පළමුවන පාණ්ඩ්‍ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා ය. (………)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැ'යි තෝරා ඊට අදළ **අංකය තිත් ඉර මත** ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැනි ප්‍රකාශය මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | හරතයන්ගේ සටන පිළිබඳ තොරතුරු දක්වෙන වෘතාන්තය මහාභාරතයයි. | මෙම සටන සිදුවූයේ නර්මදා නදිය ආසන්නයේ ය. | (………) |
| 37. | හත්වන සියවසේ දී උතුරු ඉන්දියාවේ මහා අධිරාජ්‍යක් පාලනය කළ පාලකයා වූයේ හර්ෂවර්ධන ය. | ඔහුගේ අධිරාජ්‍ය පංජාබ් සිට බ්‍රහ්මපුත්‍ර දක්වාත් හිමාලය සිට නර්මදා දක්වාත් පැතිර පැවතිණ. අයිහෝල් ලිපියේ ඔහු සකල උත්තරාපථනාථ යනුවෙන් හැඳින්වේ. | (………) |
| 38. | ඩෙකානය පාලනය කළ බටහිර චාලුක්‍යයන්ගේ අගනුවර වෙංගි විය. | බටහිර චාලුක්‍යයන්ගේ ශ්‍රේෂ්ඨතම රජු II පුලකේසින් ය. | (………) |
| 39. | අශෝක රජු තම සෙල්ලිපිවල ඇත ප්‍රදේශවලට බෞද්ධ ධර්මදූතයන් යැවීම ගැන සඳහන් කරයි. | ඔහුගේ එක් ගිරි ලිපියක් අනුව ශ්‍රී ලංකාවට එවූ දූත පිරිසේ නායකත්වය දරන ලද්දේ මහින්ද හිමි ය. | (………) |
| 40. | ගන්ධාර කලා සම්ප්‍රදය ග්‍රීක - බෞද්ධ සම්ප්‍රදයක් ලෙස හැඳින්වේ. | ගන්ධාර කලා සම්ප්‍රදයේ ප්‍රධාන අනුග්‍රාහකයෝ කුෂාණ පාලකයෝ ය. | (………) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

25-A | S | II-II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

**ඉන්දියාවේ ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1206 දක්වා**

※ **දහවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(ප්‍රශ්න අංක 10 ට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. පැරණි ඉන්දියානු ඉතිහාසය හැදෑරීමෙහි ලා පහත සඳහන් ඕනෑම මූලාශ්‍රය **දෙකක** ඇති වැදගත්කම පරීක්ෂා කරන්න.
   (i) මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා (ii) බාණභට්ටගේ හර්ෂචරිතය
   (iii) හියුං සාංගේ වාර්තාව
   (iv) සංගම් සාහිත්‍ය *(එක් කොටසකට ලකුණු 07 යි)*

2. "මොහෙන්ජොදාරෝ - හරප්පා සභ්‍යත්වය ලොව පැරණි නාගරික ශිෂ්ටාචාරවලින් එකකි."
   (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් ප්‍රදේශවල මුල් අවධියේ දී කැණීම් කළ පුරාවිද්‍යාඥයින් **දෙදෙනකු** නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) මොහෙන්ජොදාරෝ හා හරප්පා නගර අසලින් ගලායන ගංගා **දෙක** නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (iii) ඉන්දු නිම්න වැසියන්ගේ ආගමික විශ්වාස **දෙකක්** පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි)*
   (iv) ඉහත සඳහන් ප්‍රකාශය නගර සැලැස්ම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න. *(ලකුණු 08 යි)*

3. ඍග් වෛදික යුගයේ ආගමික විශ්වාස හා චාරිත්‍ර පශ්චාත් වෛදික යුගයේ දී කෙසේ වෙනස්විද'යි විස්තර කරන්න. *(ලකුණු 14 යි)*

4. ක්‍රි. පූ. හයවන සියවසේ දී උතුරු ඉන්දියාවේ සමාජ ආර්ථික තත්ත්වය පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

5. කුෂාණයෝ විදේශික පිරිසක් වුව ද ඉන්දියානු සභ්‍යත්වයට අගනා දායකත්වයක් සැපයූහ.
   (i) මධ්‍ය ආසියාවට කුෂාණ බලය ව්‍යාප්ත කළ රජු නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) කුෂාණ සමයේ දී පැවැත්වූයේ කීවැනි බෞද්ධ ධර්ම සංගායනාව ද? *(ලකුණු 01 යි)*
   (iii) කුෂාණ පාලකයන් යටතේ පැවැති ප්‍රදේශ පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න. *(ලකුණු 04 යි)*
   (iv) ඉන්දියානු සභ්‍යත්වයට කුෂාණයෙන් ලැබුණු දායකත්වය පරීක්ෂා කරන්න. *(ලකුණු 08 යි)*

6. සමුද්‍රගුප්ත රාජ සමයේ දී ගුප්ත අධිරාජ්‍ය ව්‍යාප්ත වූ අයුරු සාකච්ඡා කරන්න. *(ලකුණු 14 යි)*

7. චෝළ පරිපාලනයේ මුඛ්‍ය ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 14 යි)*

8. පහත දැක්වෙන මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක්** පිළිබඳ ඓතිහාසික සටහන් ලියන්න.
   (i) චන්ද්‍රගුප්ත මෞර්ය
   (ii) හූණ ආක්‍රමණ
   (iii) හර්ෂවර්ධන රජුගේ සංස්කෘතික හා ආගමික කටයුතු
   (iv) ජටාවර්මන් සුන්දර පාණ්ඩ්‍යගේ කාර්ය සාඵල්‍යය *(එක් කොටසකට ලකුණු 07 බැගිනි)*

9. ගස්නි මහමුද්ගේ සහ ගෝරිහි මහමුද්ගේ ආක්‍රමණ සාර්ථකවීමට බලපෑ සාධක පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

10. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කර**, ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.
    (i) ලෝතාල් (ii) පුරුෂපුර (iii) කෞෂම්බි
    (iv) ගෝදාවරී (v) මක්රාන් කපොල්ල (vi) උජ්ජේනි
    (vii) කාවේරි පටුන (viii) සත්පුර කඳුවැටිය
    *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

* * *

18676

AL/2010/25-A-S/T/E-II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

25-A

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 10

විභාග අංකය / சுட்டெண் / Index No. ..................................



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

3422

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**25-B | S | II-I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

**ඉතිහාසය II (I කොටස)**
**வரலாறு II (பகுதி I)**
**History II (Part I)**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

**යුරෝපා ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1950 දක්වා**

විභාග අංකය: ..................................

**වැදගත්**

- ※ මෙම කොටසේ ප්‍රශ්න **40** ක් ඇත. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- ※ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- ※ **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- ※ කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

● අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය තිත් ඉර මත ලියන්න.**

**1.** (1) පිරනීස් (2) කොකේසස් (3) මර්මාරා
(4) ඇල්ප්ස් (5) බෝල්කන් (.........)

**2.** (1) ලොරේන් (2) මැඩ්රිඩ් (3) කෝපන්හේගන්
(4) බ්‍රසල්ස් (5) පැරිස් (.........)

**3.** (1) ජෝන් වයික්ලිෆ් (2) ජෝන් හස් (3) උල්රිච් ස්විංලි
(4) ෆ්‍රැන්සිස් ෂේවියර් (5) ජෝන් කැල්වින් (.........)

**4.** (1) මසක්සියෝ (2) ජියොටෝ (3) ටිටියන්
(4) පිලිප්පො ලිප්පි (5) ඩැන්ටන් (.........)

**5.** (1) සතරන්වාදය (2) වාණිජවාදය (3) ධනවාදය
(4) ඉවැන්ජලිකල්වාදය (5) රාජ්‍ය නිර්බාධවාදය (.........)

**6.** (1) VII හෙන්රි (2) වික්ටෝරියා (3) VIII හෙන්රි
(4) මේරි (5) I එලිසබෙත් (.........)

**7.** (1) ජීන් බොඩැන් (2) තොමස් හොබ්ස් (3) ජෝර්ජ් ක්ලෙමන්සෝ
(4) ජෝන් ලොක් (5) ජීන් ජැක් රූසෝ (.........)

**8.** (1) XV ලුවී (2) මැක්සිමිලියන් (3) IV ක්‍රිස්ටියන්
(4) වොලන්ස්ටයින් (5) ගුස්ටාවුස් ඇඩොල්ෆස් (.........)

**9.** (1) අයි ලා චැපල් (2) ට්‍රොපෝව් (3) ලයිබැක්
(4) වෙරෝනා (5) බර්ලින් (.........)

**10.** (1) බෙනිටෝ මුසෝලිනී (2) ලොයිඩ් ජෝර්ජ් (3) වින්ස්ටන් චර්චිල්
(4) ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට් (5) ජෝශප් ස්ටාලින් (.........)

[ දෙවැනි පිටුව බලන්න.

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **තිත් ඉර මත ලියන්න.**

**11.** (1) තේම්ස් - ලන්ඩන්
(2) ඩැනියුබ් - වියනා
(3) එල්බ් - සරයේවෝ
(4) ටයිබර් - රෝමය
(5) විස්ටියුලා - ඩැන්සිග් (.........)

**12.** (1) වස්කෝ ද ගාමා - ඉන්දියාව
(2) කොලම්බස් - හිස්පැනියෝලාව
(3) කබ්රාල් - බ්‍රසීලය
(4) කෝර්ටීස් - ආර්ජන්ටිනාව
(5) මාර්ක්වෙටේ - ක්වෙබෙක් (.........)

**13.** (1) අමෙරිගෝ වෙස්පුචි - දේශගවේශකයෙකි.
(2) V චාල්ස් - ශුද්ධ රෝම අධිරාජයෙකි.
(3) වෝල්ටර් රැලේ - ප්‍රංශ මුහුදු කොල්ලකාරයෙකි.
(4) රොබට් වෝල්පෝල් - එංගලන්තයේ අගමැතිවරයෙකි.
(5) වොන් රූන් - ප්‍රශියානු සෙන්පතියෙකි. (.........)

**14.** (1) රිචලිව් - ප්‍රංශයේ ප්‍රධාන ඇමැතිවරයා
(2) කාසල්රී - එංගලන්තයේ අගමැතිවරයා
(3) මෙටර්නික් - ඔස්ට්‍රියාවේ චාන්සලර්වරයා
(4) කැවූර් - පීඩ්මොන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ අගමැතිවරයා
(5) බිස්මාර්ක් - ප්‍රශියාවේ චාන්සලර්වරයා (.........)

**15.** (1) ගිරොන්ඩින්වරු - ස්පාඤ්ඤය
(2) ජැකොබින්වරු - ප්‍රංශය
(3) නට්සිවාදය - ජර්මනිය
(4) ෆැසිස්ට්වාදය - ඉතාලිය
(5) මෙන්ෂෙවික්වරු - රුසියාව (.........)

● අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **තිත් ඉර මත ලියන්න.**

**16.**

| X | Y |
|---|---|
| (i) වැඩවසම්ක්‍රමය | A පුද්ගලවාදය |
| (ii) ධනවාදය | B සමාජවාදය |
| (iii) පුනරුදය | C මානවවාදය |
| (iv) දේශ ගවේෂණ | D යටත්විජිතවාදය |
| (v) බොල්ෂෙවික් විප්ලවය | E සාමූහිකත්වය |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**17.**

| X | Y |
|---|---|
| (i) බොටිචෙලි | A ඩේවිඩ් |
| (ii) ලෙනාඩෝ ඩා වින්චි | B මෝසෙස් |
| (iii) රෆායල් | C මොනා ලිසා |
| (iv) ඩොනටෙලෝ | D ඇතන්ස්හි පාසල |
| (v) මයිකලාංජලෝ | E වීනස්ගේ උපත |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**18.**

| X | Y |
|---|---|
| (i) නාවික හෙන්රි | A ලන්දේසි |
| (ii) වස්කෝ ද බැල්බෝවා | B ඉංග්‍රීසි |
| (iii) ෆ්‍රැන්සිස් ඩ්‍රේක් | C ප්‍රංශ |
| (iv) ජැක් කාටියර් | D ස්පාඤ්ඤ |
| (v) හෙන්රි හඩ්සන් | E පෘතුගීසි |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

**19.**

| X | Y |
|---|---|
| (i) ෆ්‍රැන්සෙස්කො ගුයිසියාඩිනි | A ජාතීන්ගේ ධනය |
| (ii) විලියම් ෂේක්ස්පියර් | B වෙනීසියේ වෙළෙන්ද |
| (iii) මොන්ටෙස්කියු | C දස් කපිතාල් |
| (iv) ඇඩම් ස්මිත් | D නීතියේ සාරය |
| (v) කාල් මාර්ක්ස් | E ඉතාලියේ ඉතිහාසය |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**20.**

| X | Y |
|---|---|
| (i) VII හෙන්රි | A පූර්ණ ඵල විකිණීම |
| (ii) ටෙට්සල් | B ගෙස්ටපෝ |
| (iii) IV හෙන්රි | C නැන්ටීස් ආඥාව |
| (iv) මැසිනි | D තරුණ ඉතාලිය |
| (v) හිට්ලර් | E රෝස යුද්ධ |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**21.**

| X | Y |
|---|---|
| (i) නව ලෝකය | A අප්‍රිකා මහද්වීපය |
| (ii) අඳුරු මහද්වීපය | B තුර්කිය |
| (iii) 'යුරෝපයේ රෝගියා' | C බ්‍රිතාන්‍යය |
| (iv) 'භූගෝලීය පදයක් පමණි' | D ඉතාලිය |
| (v) 'සාප්පුකාර ජාතිය' | E අමෙරිකා මහද්වීපය |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**22.**

| X | Y |
|---|---|
| (i) මාටින් ලූතර් | A ප්‍රංශ විප්ලවය |
| (ii) III විලියම් | B රුසියානු විප්ලවය |
| (iii) රිචඩ් ආක්රයිට් | C උත්කෘෂ්ට විප්ලවය |
| (iv) මිරාබෝ | D කාර්මික විප්ලවය |
| (v) ලියොන් ට්‍රොට්ස්කි | E ප්‍රොතෙස්තාන්ත විප්ලවය |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**23.**

| X | Y |
|---|---|
| (i) 'යමෙක් රාජ්‍ය කරයි ද, ඔහුගේ ආගම රටවැසියාගේ ද ආගම විය යුතු ය.' | A XIV ලුවී |
| (ii) 'රජය නම් මම වෙමි.' | B 1689 අයිතිවාසිකම් පනත |
| (iii) 'එංගලන්තයේ රජු රෝමානු කතෝලිකයකු නොවිය යුතු ය.' | C වර්සායි ගිවිසුම |
| (iv) නිත්‍යානුකූලභාවය පිළිබඳ මූලධර්මය | D වියානා සම්මේලනය |
| (v) ජාතික ස්වයං-නිර්ණය පිළිබඳ මූලධර්මය | E ඔග්ස්බර්ග් සාම ගිවිසුම |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**24.**

| X | Y |
|---|---|
| (i) යුට්රෙච්ට් ගිවිසුම | A 1919 |
| (ii) ලුනෙවිල් ගිවිසුම | B 1807 |
| (iii) ටිල්සිට් ගිවිසුම | C 1859 |
| (iv) විලාෆ්‍රැන්කා ගිවිසුම | D 1801 |
| (v) වර්සායි ගිවිසුම | E 1713 |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

**25.**

| X | Y |
|---|---|
| (i) වෝර්සෝ | A නෙදර්ලන්තය |
| (ii) බුඩාපෙස්ට් | B හංගේරියාව |
| (iii) බර්ලින් | C ස්විට්සර්ලන්තය |
| (iv) ඇම්ස්ටර්ඩෑම් | D ජර්මනිය |
| (v) ජිනීවා | E පෝලන්තය |

(1) EABDC (2) EBDAC (3) ECDAB (4) EDBCA (5) EACDB (.........)

[ හතරවෙනි පිටුව බලන්න.

3422

● අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් .................................... 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් .................................... 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් .................................... 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් .................................... 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... 5 ද, **තිත් ඉර මත ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26. පහත දැක්වෙන ඒවා අතුරෙන් වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ කවරේ ද?**
(A) වහල් ක්‍රමය
(B) ප්‍රවේණි ක්‍රමය
(C) ස්වයංපෝෂිත ආර්ථිකය
(D) දියුණු වෙළඳාම (.........)

**27. පහත දැක්වෙන ඒවා අතුරෙන් ජාතික රාජ්‍යයක ලක්ෂණ කවරේ ද?**
(A) ශක්තිමත් නිත්‍ය යුද්ධ හමුදාව
(B) පරමාධිකාරී රාජාණ්ඩුව
(C) නිශ්චිත දේශසීමා
(D) ශක්තිමත් ප්‍රාදේශීය පාලකයන් (.........)

**28. පහත සඳහන් පුද්ගලයන් අතුරෙන් වියනා සම්මේලනයේ දී ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ, බලවත් යුරෝපා රටවල නියෝජිතයන් නම් කරන්න.**
(A) I සාර් ඇලෙක්සැන්ඩර්
(B) මෙටර්නික්
(C) XVII ලුවී
(D) පාමර්ස්ටන් (.........)

**29. පහත සඳහන් ගිවිසුම් අතුරෙන් I ලෝක යුද්ධය අවසානයේ දී අත්සන් කරන ලද ඒවා කවරේ ද?**
(A) ඒමියන්ස් ගිවිසුම
(B) පැරිස් ගිවිසුම
(C) ශා. ජර්මේන් ගිවිසුම
(D) ට්‍රියනොන් ගිවිසුම (.........)

**30. පහත සඳහන් ඒවා අතුරෙන් II ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් සාධක කවරේ ද?**
(A) ජර්මනියේ නට්සිවාදය නැගී ඒම
(B) රුසියාව හා ඉතාලිය අතර යටත් විජිත සඳහා වූ තරගය
(C) ජාතීන්ගේ සංගමයේ අසාර්ථකත්වය
(D) අමෙරිකා එක්සත් ජනපදය ජර්මනියට ආධාර දීම (.........)

● අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදාළ මාතෘකාවට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **තිත් ඉර** මත ලියන්න.

**31. දේශ ගවේෂණ**
(1) පෘතුගාලය සහ ස්පාඤ්ඤය යන රටවල් පුරෝගාමී විය.
(2) ප්‍රධාන අරමුණ වූයේ වෙළඳාමයි.
(3) සියලු ගවේෂණ කොන්ස්තන්තිනෝපලය කේන්ද්‍රකරගෙන සිදුවිය.
(4) අප්‍රිකානු මහද්වීපයේ දකුණු තුඩුවට ළඟා වූ පළමුවන පෘතුගීසි ජාතිකයා, බර්තොලමියු ඩයස් ය.
(5) ෆ්‍රැන්සිස්කෝ පිසාරෝ පීරු දේශය ජයග්‍රහණය කළේ ය. (.........)

**32. තිස් අවුරුදු යුද්ධය**
(1) කතෝලික හා ප්‍රොතෙස්තාන්ත රාජ්‍ය අතර යුද්ධයක් ලෙස ආරම්භ විය.
(2) යුද්ධය ඇති වූ ප්‍රධාන මධ්‍යස්ථානය වූයේ ජර්මනියයි.
(3) ඔග්ස්බර්ග් සාම ගිවිසුමේ අඩුපාඩු යුද්ධය ඇතිවීමට තුඩු දුන් ප්‍රධාන හේතුවකි.
(4) මෙම යුද්ධය යුරෝපයේ ඇති වූ අවසාන ආගමික යුද්ධය ලෙස සලකනු ලැබේ.
(5) යුද්ධය අවසානයේ දී ප්‍රංශය පරාජයට පත් විය. (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

**33.** **ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන අවස්ථා**
(1) එස්ටේට්ස් ජෙනරල් සභාව කැඳවීම
(2) ටෙනිස් පිටියේ දිවුරුම
(3) බැස්ටීලයට පහර දීම
(4) XVI ලුවී රජින් පිටුවහල් කිරීම
(5) සමූහාණ්ඩුවක් පිහිටුවීම (………)

**34.** **ජර්මනිය එක්සත් කිරීම**
(1) ෆ්‍රැන්ක්ෆර්ට් සම්මේලනය
(2) ඔස්ට්‍රියානු නායකත්වය යටතේ එක්සත්භාවය සාක්ෂාත්කර ගැනීම
(3) බිස්මාර්ක්ගේ ලේ සහ යකඩ ප්‍රතිපත්තිය
(4) උතුරු ජර්මන් සංයුක්ත රාජ්‍යය පිහිටුවීම
(5) I විලියම් ජර්මන් අධිරාජයා බවට පත්වීම (………)

**35.** **I ලෝක යුද්ධය**
(1) ඔස්ට්‍රියාවේ ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා සරයේවෝහිදී ඝාතනය කරනු ලැබීම
(2) රුසියාව හා තුර්කිය අතර වූ මිත්‍රත්වය
(3) ඉතාලිය මිත්‍ර පක්ෂය ගෙන යුද්ධයට අවතීර්ණවීම
(4) අමෙරිකා එක්සත් ජනපදය, ජර්මනියට විරුද්ධව යුද්ධ ප්‍රකාශ කිරීම
(5) ජර්මනිය පරාජයට පත්වීම (………)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය තිත් ඉර මත ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** | |
|---|---|---|---|
| **36.** | මධ්‍යතන යුගයේ දී, ක්‍රිස්තියානිය පදනම්කොටගත් පොදු ශිෂ්ටාචාරයක් බටහිර යුරෝපයේ විකාශනය විය. | මුල් කාලීන මානව වාදියකු වූ පෙට්රාක් ඇතැම් විට මානව වාදයේ පියා ලෙස හඳුන්වනු ලැබේ. | (………) |
| **37.** | යුරෝපා මහද්වීපයේ විප්ලව මර්දනය කිරීමට මෙටර්නික් විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය මහාද්වීපික ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. | 1830 ප්‍රංශයේ ඇති වූ විප්ලවය, ලුවී කොස්යුත් විසින් මෙහෙයවන ලදී. | (………) |
| **38.** | 1848 විප්ලවය ඉතා කෙටි කාලයක් තුළ යුරෝපයේ නගර බොහොමයක පැතිර ගියේ ය. | 1848 පෙබරවාරි මස 22 සහ 24 අතර පැරීසියේ ඇති වූ විප්ලවය පිළිබඳ පුවත ඇසීමෙන් හටගත් විරෝධය, 1848 මාර්තු මස 13 සහ 18 අතර කාලයේ වියනා, මිලාන්, වෙනිස් හා බර්ලින් යන නගරවල ජනතා නැගී සිටීම් ඇතිවීමට තුඩු දුන්නේ ය. | (………) |
| **39.** | සිය කරුනු දහතරේ වැඩ පිළිවෙළ තුළ වුඩ්රෝ විල්සන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම් කරගෙන, I ලෝක යුද්ධයෙන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවනු ලැබීය. | 1870 සිට පාප් සංස්ථාව හා ඉතාලි ආණ්ඩුව අතර පැවැති මතභේදය, 1929 දී එළඹි ලැටරන් ගිවිසුම මගින් විසඳීමට මුසෝලිනී සමත් විය. | (………) |
| **40.** | ශීඝ්‍ර කාර්මික සංවර්ධනයක් ඇතිකිරීම අරමුණු කොටගෙන, ස්ටාලින් රුසියාව තුළ පස් අවුරුදු සැලසුම් මාලාවක් ක්‍රියාත්මක කළේ ය. | II ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ වයිමාර් සමූහාණ්ඩුව පිහිටුවනු ලැබී ය. | (………) |

**

[ හයවෙනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

25-B | S | II-II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

**යුරෝපා ඉතිහාසය - ක්‍රි. ව. 1500 සිට 1950 දක්වා**

※ **දහවැනි** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(ප්‍රශ්න අංක 10ට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. "පුනරුදය යනු මධ්‍යතන යුරෝපය, නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයයි."
   (i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) 'පුනරුදය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද'යි අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)
   (iii) පුනරුදය ඇති වීමට තුඩු දුන් සාධක කවරේ ද? (ලකුණු 04 යි)
   (iv) පුනරුදයේ ප්‍රතිඵල ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. (ලකුණු 07 යි)

2. "ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඇතිවීමට තුඩු දුන් සාධක එවක පැවැති ආගමික මෙන්ම දේශපාලන හා ආර්ථික තත්ත්වයන් සමඟ කිට්ටුවෙන් බැඳී පැවතුණි." සාකච්ඡා කරන්න. (ලකුණු 14 යි)

3. 1688 සිට 1848 දක්වා එංගලන්තයේ පාර්ලිමේන්තු ක්‍රමය වර්ධනය වූ ආකාරය පහත දැක්වෙන අංශ කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්ෂා කරන්න.
   (i) සීමිත රාජාණ්ඩුවක් වර්ධනය වීම
   (ii) අගමැති ධුරයේ හා කැබිනට් ක්‍රමයේ වර්ධනය
   (iii) ඡන්ද බලය පුළුල්වීම (ලකුණු 14 යි)

4. එංගලන්තයේ කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ආර්ථික හා සමාජ ප්‍රතිඵල සැකෙවින් විග්‍රහ කරන්න. (ලකුණු 14 යි)

5. "නැපෝලියන් බොනපාට් යුරෝපයේ බිහි වූ ශ්‍රේෂ්ඨතම රාජ්‍යතාන්ත්‍රිකයකු ලෙස සලකනු ලැබේ."
   (i) නැපෝලියන් බොනපාට්ගේ උපන් බිම නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) ප්‍රංශයේ අධිරාජ තනතුරට පත්වීමට පෙර නැපෝලියන් බොනපාට් විසින් මෙහෙයවන ලද විදේශ ආක්‍රමණ මොනවා ද? (ලකුණු 02 යි)
   (iii) අධිරාජ තනතුරට පත්වීමට පෙර නැපෝලියන් බොනපාට් දැරූ වැදගත් දේශපාලන තනතුරු කවරේ ද? (ලකුණු 02 යි)
   (iv) නැපෝලියන් බොනපාට් අනුගමනය කළ දේශීය හා විදේශීය ප්‍රතිපත්ති ඇසුරෙන්, ඔහු ශ්‍රේෂ්ඨ රාජ්‍යතාන්ත්‍රිකයකු ලෙස සැලකිය හැකිද'යි විමසන්න. (ලකුණු 09 යි)

6. "ඉතාලිය එක්සත් කිරීම නායකයන් තිදෙනකුගේ උත්සාහයන්හි ප්‍රතිඵලයකි."
   (i) ඉතාලි එක්සත් ව්‍යාපාරයෙහි ලා නායකත්වය දැරූ රාජ්‍යය කුමක් ද? (ලකුණු 01 යි)
   (ii) ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවැති බාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) 1848 වන විට ඉතාලිය බෙදී පැවැති රාජ්‍ය අතුරෙන් මධ්‍යම හා දකුණු ඉතාලියේ රාජ්‍ය **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (iv) ඉතාලිය එක්සත් කිරීමෙහි ලා මැසිනි, කැවූර් හා ගැරිබෝල්ඩි යන නායකයන්ගේ දායකත්වය පිළිවෙළින් දක්වන්න. (ලකුණු 08 යි)

7. පළමුවන ලෝක යුද්ධය ආරම්භ වන විට යුරෝපය බල කඳවුරු දෙකකට බෙදී පැවැතීමට තුඩුදුන් සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 14 යි)

[ හත්වෙනි පිටුව බලන්න.

**8.** රුසියාවේ ඔක්තෝබර් විප්ලවය ඇතිවීමට තුඩු දුන් හේතු විග්‍රහ කිරීමට 'සාමය, ඉඩම් හා පාන්' නමැති බොල්ෂේවික් සටන් පාඨය කෙතෙක් දුරට ප්‍රමාණවත් වේදැ'යි පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම
(ii) ලුවී නැපෝලියන්
(iii) සොල්වරීන්
(iv) ජාතීන්ගේ සංගමය
(v) නට්සිවාදය

*(එක් කොටසකට ලකුණු 07 බැගිනි)*

**10.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කොට**, ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) සේන්
(ii) කොන්ස්තන්තිනෝපලය
(iii) රෝමය
(iv) සිසිලි
(v) ලන්ඩන්
(vi) බෝල්ටික් මුහුද
(vii) ස්වීඩනය
(viii) ජිබ්‍රෝල්ටා

*(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි.)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ඉතිහාසය II
வரலாறு II
History II

25-B

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

| | | | |
|---|---|---|---|
| ප්‍රශ්න අංකය<br>வினா இல.<br>Question No. | 10 | විභාග අංකය<br>சுட்டெண்<br>Index No. | ........................................ |




PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!